# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/Misc/51/2025**

එම්.එස්.එන්.ප්‍රභාසර

**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.01.07**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

## -<u>නියෝගය</u>-

අභියාචක වෙනුවෙන් පෙනී සිටින තිස්ස ගුණතිලක මහතා දන්වා සිටින්නේ, අභියාචක ඔහුගේ පරිවාස කාලය තුළ සිටියදී සේවයට නොපැමිණීම නිසා ඔහු සේවය අතහැර ගියා සේ සළකා නියෝගයක් නිකුත් කර ඇති බවයි. නමුත් පරිවාස කාලය තුළ කිසියම් අයෙකු සේවය කරන අවස්ථාවේදී, එම පුද්ගලයා සේවයට නොපැමිණියහොත් ඒ සඳහා නියම කළ හැකි වන්නේ, එම පුද්ගලයාගේ සේවය අත්හිටුවීමයි. එබැවින් පරිවාස කාලය තුළ කටයුතු කරමින් සිටි මෙම අභියාචක සේවයට නොපැමිණීම නිසා සේවය අතහැර යාමේ නියෝගයක් නිකුත් කිරීම දෝෂ සහිත වේ. එම තත්ත්වය ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින මාලා බස්නායක මහත්මියද පිළිගනී.

මෙම තත්ත්වය යටතේ අභියාචක විසින් දන්වා සිටින්නේ, ඔහු පරිවාස කාලය තුළ සිටි හෙයින් ඔහුගේ සේවය අත්හිටුවීමට නියෝගයක් කරන්නේ

නම්, එයින් ඔහු සෑහීමකට පත්වන බවයි. එම නියෝගය කිරීම සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවද විරුද්ධ වන්නේ නැත. ඒ අනුව අභියාචක වෙත කොළඹ දකුණ සහකාර පොලිස් අධිකාරී විසින් 2023.05.15 දිනැති අභියාචක වෙත කරන ලද තනතුර අතහැර යාමේ නියෝගය ඉවත් කරමු. ඒ වෙනුවට අභියාචක 2023.03.02 දින සිට දැනුම් දීමකින් තොරව හා නිසි අවසරයක් නොමැතිව රාජකාරියට වාර්තා නොකර තිබීම හේතුවෙන්, පරිවාස කාලය තුළ සිටි අභියාචකගේ සේවය අත්හිටුවමින් නියෝගයක් නිකුත් කරමු.

මෙම නියෝගය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු. ඉහත කරුණු සළකා බලා මෙම අභියාචනය සම්බන්ධයෙන් වන නඩු කටයුතු අවසන් කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/